# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2021 අංක 3 දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2021 ජනවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2021 ජනවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 4.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2021 අංක 3 දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2021 ජනවාරි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 34/2018

**(135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2021 අංක 3 දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනතේ 4 වන වගන්තියේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 135 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "අවම වේතන අනුප්‍රමාණ" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අවුරුදු පහළොවක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.